**මහියංගණය ප්‍රාදේශීය සභාව - 2022**
**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මහියංගණය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ශුද්ධ වත්කම් පිළිබඳ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස,ාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ .

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මහියංගණය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශේෂ පිරික්සුමෙහි වෙනස දක්වමින් පිළියෙල කර තිබුණු අවිනිශ්චිත ගිණුමෙහි රු 38,209.ක් වූ හර ශේෂය හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම මඟින් ගැලපීමට කටයුතු කරන බව. | අවිනිශ්චිත ගිණුම් ශේෂය හඳුනාගෙන ගිණුම් නිරවුල් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී උසාවි දඩ ආදායම රු 4,310,826.ක් වුවද, එය රු.2,524,955 ක් ලෙස මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | - එම - | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු 3,422,927.ක් වුවද 3,000,000.එය රු ,ක් ලෙස මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | ගිණුම් තුල අතිරික්තය රු.432,927 ක් අඩුවෙන් දක්වා ඇති අතර එය ඉදිරි වර්ෂයේ අවසන් ගිණුම තුල ගැලපීමට කටයුතු කරන බව. | -එම - |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ උසාවි දඩ ආදායම රු.2,874,820 ක් වුවද, එය රු.1,088,950 ක් ලෙස මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් තුල ගැලපීමට කටයුතු කරන බව. | - එම - |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ මුද්දර ගාස්තු ආදායම රු.2,226,086 ක් වුවද, එය රු.1,906,771 ක් ලෙස මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | - එම - | -එම - |
| (ඊ) | වර්ෂ 10 කට වැඩි කාලයක සිට පැවත එන එකතුව රු.427,936 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂයක් ව්‍යාජ වත්කමක් වශයෙන් මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ ඇතුලත් කර තිබුණි. | ශේෂ කපා හැරීමට අදාළව අමාත්‍යාංශ අනුමැතියට යොමු කර ඇති අතර. ලැබිය යුතු දෑ වලට අදාළව ඇති වැටුප් ප්‍රතිපූර්ණ හිඟ 2009 ගිණුමෙහි පවතින රු.97,294 ක් මහියංගනය මූලික රෝහල වෙත ලැබී ඇති බැවින් එය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව. | ව්‍යාජ වත්කම් ශේෂය හඳුනාගෙන සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ සහ බැංකු ප්‍රකාශනයේ දැක්වෙන ශේෂය අතර වෙනස දක්වමින් පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශනයෙහි ඇතුලත් රු.40,619 ක නොසැසදීම නිරවුල් කර නොතිබුණි. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | නොසැසඳු ගිණුම් ශේෂය නිරවුල් කරගත යුතුය |

### 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ පනතේ 2 ඡේදය | සභාවේ සභිකයින් 20 ක් 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වාර්ෂික වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ ආකෘතිපත්‍ර සභිකයින් සඳහා ලබාදී ඇති අතර සභාව වෙත භාරදුන් ආකෘතිපත්‍ර පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බව. | වාර්ෂිකව වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 14,317,436 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.37,554,458 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහියංගණ නගරයේ රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යනු ලබන බැංකු ජංගම ගිණුම අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය සහ එදිනට මුදල් පොත අනුව ශේෂය අතර බැංකු සැසඳුම් විස්තරය අනුව පැවති රු.575,579 ක නොසැසඳුනු ශේෂය හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. | නොසැසඳුනු ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | ගිණුම්වල නොසැසඳීම් හඳුනාගෙන නිරවුල් කළ යුතුය. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 3,001,655 | 3,001,655 | 2,118,521 | 883,134 | 3,001,655 | 3,001,655 | 1,713,174 | 1,288,481 |
| (ii) | කුලී | 24,471,649 | 19,649,816 | 14,098,758 | 5,551,058 | 24,471,649 | 24,512,072 | 14,516,996 | 9,995,076 |
| (iii) | වෙනත් ආදායම් | 9,500,000 | 10,051,133 | 12,129,207 | (2,078,074) | 9,500,000 | 10,599,091 | 8,452,924 | 2,146,167 |
| | එකතුව | 36,973,304 | 32,702,604 | 28,346,486 | 4,356,118 | 36,973,304 | 38,112,818 | 24,683,094 | 13,429,724 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

**සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| වසර 02 කට අධික කාලයක සිට පැවත එන හිඟහිටි වරිපනම් හා බදු රු.1,576,064 ක් සහ ජල ගාස්තු රු.610,739 ක් සමාලෝචිත වර්ෂයේදී ද අය කරගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟහිටි මුදල් සහ බදු කඩිනමින් අය කර ගත යුතුය. |
| **(ආ) මුද්දර ගාස්තු හා උසාවි දඩ** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උසාවි දඩ රු.1,088,950 ක් හා හිඟ මුද්දර ගාස්තු රු.1,906,771 ක් අය කරගෙන නොතිබුණි | සමාලෝචිත වර්ෂයට අදාළ උසාවි දඩ සකස් කර යවා ඇති අතර එයින් මාස 3ක මුදල් 2023 වර්ෂයේ ලැබී ඇත. තවත් මාස තුනක උසාවි දඩ ලැබීමට ඇති බව. | හිඟ හිටි උසාවි දඩ හා මුද්දර ගාස්තු අය කරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී සභාවට අයත් මහජන පුස්තකාලයට රු 700,000.ක පොත් මිලදී ගැනීම වෙනුවෙන් සභා අරමුදලින් ප්‍රතිපාදන වෙන්කර තිබුණද, රු.97,930 ක් පමණක් ඒ සඳහා වැය කර තිබුණි .නමුත් ඒ සඳහා පුස්තකාල උපදේශන කමිටුවේ සහ පාඨකයින්ගේ අදහස් හා යෝජනා ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී පොත් මිලදී ගැනීමේදී උපදේශන කමිටුවේ නිර්දේශ සහිතව ලබා ගැනීමට කටයුතු කරන බව. | උපදේශන කමිටුවේ නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම සභාවට අයත් නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා ඖෂධ මිලදී ගැනීම වෙනුවෙන් සභා අරමුදලින් රු.200,000 ක ප්‍රතිපාදන වෙන්කර දී තිබුණද, වසර 04 ක කාලයක් තුළ ඖෂධ මිලදී ගැනීම සඳහා සභාව කිසිදු මුදලක් වැය කර නොතිබුණු බැවින්, වාර්ෂිකව නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ සේවාලාභීන් 1000-4000 ක් අතර පිරිසකට සතුටුදායක සේවයක් සැලසීමටද නොහැකි වී තිබුණි. | 2023 වර්ෂයේ ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා ඖෂධ ලබා ගැනීම වෙනුවෙන් මේ වන විට ප්‍රසම්පාදන කටයුතු සිදුකර ඇති බව. | මහජන සෞඛ්‍ය සේවා සැපයීම අඛණ්ඩව සිදු කළ යුතුය. |
| (ඇ) | මහියංගණ ප්‍රදේශයේ දිනකට දිරන සහ නොදිරන කසළ මෙට්‍රික් ටොන් 03 කට ආසන්න ප්‍රමාණයක් බැහැර කර තිබුණි. සමාලෝචිත වර්ෂයට වසර 06 කට පෙර කසළ ප්‍රතිචක්‍රීයකරණ කටයුතු සඳහා මහියංගණ දෙහිගොල්ල ග්‍රාමයේ අක්කර 05 ක පමණ භූමියක් වෙන් කරගෙන රු.16,203,454 ක් වැය කර ස්ථිර කසළ අංගනයක් , කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකර ගොඩනැගිලි වලට අවශ්‍ය විදුලි සම්බන්ධතාවයයද ලබාගෙන තිබුණි. එසේ වුවද, ප්‍රදේශවාසීන්ගේ විරෝධතාවය හේතුවෙන් එම ස්ථානයේ කසළ ප්‍රතිචක්‍රීයකරණ කටයුතු සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාද කර නොතිබුණි. | දෙහිගොල්ල ප්‍රදේශයේ ඉදිකර ඇති කසළ අංගනය ගොඩනැඟිල්ල 2021.08.01 දින සිට මේ දක්වා බාහිර පාර්ශ්වයකට කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා කුලී පදනම මත ලබාදී ඇති බව | වැයකර ඇති මුදලට ආර්ථිකභාවයක් ලබාදීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඈ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු කුලී හා ගාස්තු අයකර ගැනීම ලේකම්වරයාගේ කාර්යභාරයක් විය යුතු වුවද, පොදු වෙළඳපොළ බිම් මහලෙහි පිහිටි කඩ කාමර 20 සම්බන්ධයෙන් 2014 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කඩ කාමර බදු කුලී අයකර ගෙන නොතිබුණි. | බිම් මහළ කඩ හිමිකරුවන් 25 අවුරුද්දකට බදු කාලයක් ලබාදීමට කටයුතු කරන මෙන් දන්වමින් ගිවිසුම්ගත වීම ප්‍රමාද කර ඇති බව. | විධිමත්ව ගිවිසුම් වලට එළඹ බදු කුලී අය කර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | | එකතු වන කසළ දොඩම්වත්ත නව කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ විවෘත භූමියකට අවිධිමත් ලෙස බැහැර කර තිබුණු බැවින් මැස්සන් වැනි කෘමි සතුන් බෝවීමත් , වර්ෂා කාලයේදී ,දූර්ගන්ධයක් පැතිරෙන බවත් වූ කසළ සේදී ගොස් කසළ අංගනය මිශ්‍ර ආසන්නයෙන් ගලා බසින මහවැලි ගඟට නමක් පැවතුඑකතුවීමේ අවදානි. ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේ මෙම ස්ථානයේ කසළ කළමනාකරණ කටයුතු වෙනුවෙන් රු.38,284,828 ක් වැය කර තිබුණි. | කොම්පෝස්ට් හලන යන්ත්‍රයක් හා කැබලි කරන යන්ත්‍රයක් අප ආයතනයට ලැබී ඇති අතර බේලින් මැෂිමක් සහ ෂොපින් කටින් මැෂිමක් ලබා ගැනීමට පළාත් පාලන කොමසාරිස් තුමා වෙත ඉල්ලීම් ලිපියක් යොමු කර ඇත. කඩිනමින් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමට කටයුතු සිදු කරමින් පවතින බව. | දිගුකාලීනව කසළ ප්‍රතිචක්‍රීයකරණය සඳහා විධිමත් සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඊ) | (i) | ප්‍රාදේශීය සභාවට අයත් කැබලි අංක 5035 දරන ඉඩමේ ඉදිකර තිබුණු පැරණි වෙළඳපළ කඩ කාමර 24 ක් හා පොළ භූමියේ කුට්ටි කඩ කාමර 20 ක් කඩා ඉවත් කර නව නඩ කාමර 88 ක්, සිනමා ශාලාවක් සහ කුට්ටි කඩ කාමර 32 කින් යුත් වෙළඳ සංකීර්ණයක් පුද්ගලයින් කිහිපදෙනෙකු එකතු වී පිහිටුවා ගත් වෙළඳ සංගමයක් මඟින් මුදල් රැස්කර 2012 වර්ෂයේ සිට ඉදිකරමින් පැවතියද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාද එහි වැඩ නිමකර නොතිබුණි. | මහියංගණය ප්‍රාදේශීය සභාව සහ මහියංගණය පොදු වෙළෙඳ සංගමය සමඟ ගිවිසුම්ගතව රජයේ දායකත්වයකින් තොරව වෙළෙඳ සංගමයේ මැදිහත්වීමෙන් බදුකරුවන්ගෙන් මුදල් අයකර කොන්ත්‍රාත් ආයතනයක් හරහා සිදුකර ඇතඑමෙන්ම ඉදිකිරීම් . අවසානයේ සභාව වෙත පැවරීමේ එකඟතාවය මත ඉදිකිරීම් කර ඇති බව. | සභාවට අයත් ඉඩමක ඉදිකිරීම් සිදු කිරීමේදී විධිමත් ගිවිසුමකට එළඹිය යුතු අතර,කඩිනමින් ව්‍යාපෘති නිම කරවා ගත යුතුය. |
| | (ii) | මෙවැනි ව්‍යාපෘති සිදු කිරීමේදී ව්‍යාපෘති වාර්තා සකස් කර, ඒ පිළිබඳ අධ්‍යයනය කර ඒ සඳහා ඇමතිවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු විධිමත් ගිවිසුම් ප්‍රකාරව අදාළ ව්‍යාපෘති ආරම්භ කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර, ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම සභාවේ පාලනයෙන් තොරව ක්‍රියාත්මක කරමින් පැවතුනි. | | |
| | (iii) | 2015 මාර්තු 10 වන දින අනුමත කර තිබූ ගොඩනැගිලි සැලැස්මට අනුකූල නොවන අයුරින් ගොඩනැගිල්ලේ ප්‍රධාන ඇතුල්වීමේ ස්ථානය හා යෝජිත සිනමාශාලාවක් සඳහා වැඩ ආරම්භ කර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අනුමත සැලසුමකට අනුව කාර්මික නිලධාරිගේ අධීක්ෂණය යටතේ ඉදිකිරීම් සිදු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බදුල්ල දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා දියත් කර තිබුණු විශේෂ වැඩ සටහන යටතේ 2013 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් රුපියල් මිලියන 21.5 ක මුදලක් වැය කර මහියංගණය ලංකා ගමනාගමන මණ්ඩල බස් නැවතුම්පොළෙහි කඩ කාමර 29 ක් ඉදිකර තිබුණි. විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් | අදාළ කඩ කාමර 29 අවස්ථා කිහිපයකදී ටෙන්ඩර් කළ අතර එහිදී කඩ කාමර 11ක් ටෙන්ඩර් විය. ඉන් 5ක් ගිවිසුම් ගතවී ඇති නමුත් ඉතිරි කඩ කාමර 6න් 3කට අදාළව වාරණ නියෝගයක් | නව කොන්දේසි යටතේ විධිමත් ප්‍රසම්පාදනයක් තුළින් කඩ කාමර බදු දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කඩ කාමර බදුදීම සඳහා සභාවට බලය පවරා තිබුණද, 2014 ජනවාරි සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම කඩ කාමර විධිමත්ම බාහිර පාර්ශවයන්ට බදු නොදීම හේතුවෙන් සභාවට රු.10,040,000 ක කඩ කුලී ආදායමක් අහිමි වී තිබුණි. | පනවා ඇති බැවින් ගිවිසුම්ගතවීම තාවකාලිකව නවතා ඇත. ඉතිරි කඩ කාමර ඉදිරියේදී ටෙන්ඩර් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | |
| (ආ) | 2013 ඔක්තෝබර් 25 දින මහියංගණය ලංකා ගමනාගමන මණ්ඩල බස් නැවතුම්පොළෙහි කඩ කාමරය බදුදීමට ඉදිරිපත් කළ අවම ලංසු මුදල රු.1,200,000 ක් වූ අතර, එක් බදුකරුවකු පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණු බැවින්, ලංසුව විවෘත නොකර සභා තීරණයකින් පසුව දන්වන බව අදාළ ලංසුකරුට දන්වා තිබුණි. ඒ අනුව විධිමත්ව ගිවිසුම්ගත වී තඩ කාමරය බදු නොදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.2,348,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | අදාළ කඩ කාමරය ලබාදීම සම්බන්ධයෙන් මහ සභාවේ අනුමැතිය ලද අතර මේ වන විට විධිමත්ව ගිවිසුම් ගතවී ඇති බව. | නව කොන්දේසි යටතේ විධිමත් ප්‍රසම්පාදනයක් තුළින් කඩ කාමර බදු දිය යුතුය. |
| (ඇ) | සභාව විසින් සතිපොළ භූමියෙහි පැරණි කඩ කාමර ප්‍රතිසංස්කරණය නීත්‍යානුකූල ක්‍රමවේදයකට සිදු නොකිරීම නිසා සතිපොළ භූමියෙහි තිබූ කඩ කාමර 2012 කින් 49 නොවැම්බර් සිට සමාලෝචිත වර්ෂයේ 31 දෙසැම්බර් දක්වා සභාවට අහිමි වු ආදායම රු 5,776,700.ක් විය. | පිළිතුරු ලබා දී නොමැත. | නීත්‍යානුකූල ක්‍රමවේදයකට අනුව හා සභා අරමුදලට අවාසිදායක නොවන ලෙස කටයුතු කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවට අයත් රු 4,522,404.වු ට්‍රැක්ටර් රථ ක් 02සහ කම්පැක්ටර් රථය වසර තුනකට වඩා වැඩි කාලයක් සභා පරිශ්‍රයේ සහ මහියංගණ ප්‍රදේශයේ පෞද්ගලික ආයතනයක අලුත්වැඩියා කටයුතු සඳහා ගාල් කර තිබුණි. | කම්පැක්ටර් රථයේ කසළ තද කිරීමට ඇති කොටස නිසියාකාරව ක්‍රියාත්මක නොවීම නිසා කසළ එකතු කිරීමේ ක්‍රියාවලියට යොදාගැනීමට අපහසුවී ඇති අතර ට්‍රැක්ටර් රථ අළුත්වැඩියාවන් සිදුකර භාවිතයට ගැනීමට කටයුතු කරන බව. | සභාව සතු වත්කම් ඵලදායි කාර්යයන් සඳහා කාර්යක්ෂමව යොදාගත යුතුය. |
| (ආ) | මෝටර් ග්‍රේඩරය සහ ගල්රෝල කුලියට දීම වෙනුවෙන් 2021 වර්ෂය සඳහා අයවිය යුතු රු.1,129,900 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් අය කරගෙන නොතිබුණි. | මෝටර් ග්‍රේඩරය හා ගලි බවුසරය කුලියට දීම වෙනුවෙන් 2022.12.31 දිනට අයවිය යුතු ශේෂය රු. 281,561 ක් වන අතර ගලි බවුසරයට අදාළ හිඟය වන රු. 127,461 ක මුදල 2023 වර්ෂයේ අයකරගෙන ඇති බව. | හිඟ හිටි කුලී ආදායම් කඩිනමින් අය කර ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### පාරිසරික ගැටළු

| | | |
|---|---|---|
| මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ නිර්දේශ ලබා නොගෙන හා පාරිසරික අධ්‍යයනයක්ද සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී සහා අරමුදලින් රු 778,500.ක් වැය කර නිසල අරණ ආදාහනාගාර භූමියට යාබදව ගලා බසින මහවැලි ගඟ ආසන්නයේ ගලි අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ගලි වලක් සකස් කර තිබුණි. 2023 පෙබරවාරි 23 වන පරීක්ෂණ දිනටද ගලි වල භාවිතා කර නොතිබූ අතර, මාස 07 ක කාලයක් තුළ එහි ඉවුරු කඩා වැටී වලෙහි ධාරිතාවය අඩු වී තිබුණි. | කාර්මික නිළධාරීගේ අධීක්ෂණය යටතේ ගලි වල ඉදිකිරීම සිදුකර ඇත. මේවන විට ගලි වලවල් දෙකම ගලි දැමීම සඳහා යොදාගන්නා බව. | ගලි ද්‍රව්‍ය බැහැර කිරීමට ගලි වල පිළියෙල කළ යුතුය. |